2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ නිවේදනයයි

සමාගමේ නම : විෂ්නු ඉංජිනියරින් (ප්‍රයිවට්) එල්ටීඩී
සමාගමේ අංකය : PV 97683
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : 9 B, පීටර්ස් ලෙන්, දෙහිවල
සංස්ථාගත කිරීමේ දිනය : 2014.03.19

ලියාපදිංචි ලේකම්වරු.

08-200/2

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සීමිත වගකීම් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නාමය : එඩ්වඩ් ඇන්ඩ් ක්‍රිස්ටී රෙඩි - මික්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පීවී 122968
සංස්ථාගත කළ දිනය : 2017 ජුනි මස 9 වැනි දින
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 64/10, නාවල පාර. නුගේගොඩ.

සමාගමේ ලේකම්.

08-206

---

## දැන්වීමයි

2007 අංක 07 දරන නව සමාගම් පනතේ 9(1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ජෙටර්ස් පබ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 123912
ලියාපදිංචි දිනය : 2017.07.17
ලියාපදිංචි ලිපිනය : අංක 103, E 4, අලුත් නුවර පාර, කොතලාවල, කඩුවෙල.

සමාගමේ නම : හාව් පබ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 123918
ලියාපදිංචි දිනය : 2017.07.17
ලියාපදිංචි ලිපිනය : අංක 743/57, තලංගම උතුර, බත්තරමුල්ල.

ඩබ්. එස්. වීරමන්,
ලේකම්.

08-222

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් දැනුම් දෙන ලද්දේ අංක 738 සහ 2005.12.08 වැනි දිනැති කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. ජේ. ජයවර්ධන විසින් සහතික කරන ලද වත්තල, හැඳල, පොකුණ පාර, අංක 39/3 හි පදිංචි තේවරාජා උදයකුමාර් යන අයට එම ලිපිනයේ ම පදිංචි ගණේෂරාජා තුෂ්යන්ති වි. පෙ. සෙල්වරාසා තුෂ්යන්ති වන මා විසින් ලබාදුන් ඇටෝර්නි බලපත්‍රය 2017.07.20 වැනි දින සිට අවලංගු කර අහෝසි කරන ලදී. මෙදින සිට ඇටෝර්නි බලකරු විසින් ඉහත සඳහන් ඇටෝර්නි බලපත්‍රය යටතේ කරන ලද කිසියම් ක්‍රියාවලට සහ පියවරවලට මා වගකියනු නොලැබේ.

ගණේෂරාජා තුෂ්යන්ති.

2017 ජූලි මස 20 වැනි දින.

08-219

---

## වරයිට් ද චිල්ඩ්රන්ස් චැරිටි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම.

2017 ජූලි මස 10 වැනි දින සමාගම් ලියාපදිංචි අංක ජී ඒ 3360 යටතේ ''වරයිට් ද චිල්ඩ්රන්ස් චැරිටි'' යන නාමය යටතේ නව සමාගමක් (ඇපයෙන් සීමිත) සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 28, (2 වන මහල) ඩබ්ලිව්.ඒ.ඩී. රාමනායක මාවත, කොළඹ 02 යන ස්ථානයේ බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

එම් ඇන්ඩ් ඒ කම්පනි සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරු,

අංක 28, (2 වන මහල),
ඩබ්ලිව්.ඒ.ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

08-191

---

## ඇඩ්කොච් ඉන්ටර්නැෂනල් ඇඩ්වර්ටයිසිං ඇන්ඩ් මාර්කටිං (පීවීටී) එල්ටීඩී

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම.

2017 ජූනි මස 22 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පීවී 122536 යටතේ ''ඇඩ්කොච් ඉන්ටර්නැෂනල් ඇඩ්වර්ටයිසිං ඇන්ඩ් මාර්කටිං (පීවීටී) එල්ටීඩී'' යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 28, (2 වන මහල) ඩබ්ලිව්.ඒ.ඩී. රාමනායක මාවත, කොළඹ 02 යන ස්ථානයේ බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

එම් ඇන්ඩ් ඒ කම්පනි සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ ලේකම්වරු).

අංක 28, (2 වන මහල),
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

08-192

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකාවේ කොළඹ 13, විවේකානන්ද හිල්, අංක 98හි පදිංචි ෂන්මුගම්සන්ගාරපිල්ලෙයිඥාණප්‍රකාශම් (ජාතික හැඳුනුම්පත් අංකය 382120884 X) වන මා සියල්ලන්ගේම දැනගැනීම පිණිස දන්වා සිටින වග නම්, මා විසින් කොළඹ 13, විවේකානන්ද හිල් , අංක 98හි පදිංචි ෂන්මුගම්සන්ගාරපිල්ලෙයිරාජරත්නම් යන අයට ලබාදී තිබූ, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නවරත්නම් සම්බන්ධන් මහතා විසින් සහතික කරන ලද බත්තරමුල්ලේ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දෙල්කඳ පිහිටි බටහිර කලාප කාර්යාලයේ CC407 වන පොත් කාණ්ඩයේ 409 වන පත්ඉරුවේ සහ අංක 17988 සහ 1973 ජූලි මස 21 දරන දින සටහන් පොතේ ලියාපදිංචි කරන ලද අංක 2954 දරන සහ 1973 ජූනි 14 මස දිනැති ඇටෝර්නි බලපත්‍රය මෙම දැන්වීමෙහි සඳහන් දිනයේ සිට බලපවත්වන පරිදි මා විසින් අවලංගු කර නිෂ්ප්‍රභා කර බල රහිත කරන බවත්, එකී බලපත්‍රය යටතේ මින් ඉදිරියට එකී පුද්ගලයා විසින් කරනු ලබන කිසිදු කටයුත්තක් සඳහා හෝ ඇතුළු වන කිසිදු ගනුදෙනුවක් සඳහා හෝ මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

ෂන්මුගම්සන්ගාරපිල්ලෙයි ඥාණප්‍රකාශම්.

වර්ෂ 2017 ක්වූ ජූනි මස දින දී ය.

08-174

---

## ඇටෝර්නි බලය අහෝසි කිරීම

මල්වාන,වතුරබොඩ, අංක 55/02, සදහම් සෙවණ විහාරස්ථානය යන ලිපිනයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 821723256V හිමි පූජ්‍ය පෝරේ විමලරතන හිමි වන මම, ප්‍රසිද්ධ නොතාරිස් කේ.ඩබ්ලිව්.ටී.එල්.පෙරේරා මහතා විසින් 2017.04.30 වැනි දින ලියා සහතික කරන ලද අංක 43 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් එහි ඇටෝර්නි බලකරු වන කිරිඇල්ලේ ධම්මාරාම හිමියන් වෙත පවරන ලද ඇටෝර්නි බලය 2017.07.01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන්නට යෙදුන බවත්, එකී බලය යටතේ එම ඇටෝර්නි බලකරු විසින් සිදුකරනු ලබන කිසිම ක්‍රියාවක් පිළිබඳව මාගේ වගකීමක් නොමැති බවත් මෙයින් දන්වා සිටිමි.

පූජ්‍ය පෝරේ විමලරතන හිමි.

08 - 180

# රටබීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත්

## උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

### විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම - 2018 වර්ෂය

1982 වර්ෂයේ අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ 1983 වර්ෂය හා ඊට පසු කාල පරිච්ඡේදය සඳහා විදේශ මත්පැන් විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී වලංගුව පවත්නා සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව, 2018 වර්ෂය තුළ විදේශ මත්පැන් සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිලදී ගැනීම සඳහා උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැන වන, මා විසින් 2017.08.21 වැනි දින පෙ. ව. 10.30 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නිසි ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර,

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් මුදලක් තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක්, සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපළ පිළිබඳව වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කෙරේ. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවය සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු යඃ-

(i) ටෙන්ඩර් පත්‍ර මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය;

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර පෝරමවල නියමිත සාක්ෂිකරුවන් අත්සන් යොදා තිබිය යුතු ය;

(iii) සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක්ම ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතු ය.

මෙහි නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත්ව සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර -

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර ලබා ගන්නා ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කුවිතාන්සියක්; හා

*(ආ)* වත්කම් සහතිකයක් සමග
ලියුම් කවරයක බහා මුද්‍රා තබා ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ තැබෑරුම් අංකය සහ නම සඳහන් කර උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් කිරීමට ප්‍රථම තැන්පත් කළ යුතුය. එසේ නැතහොත් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථමයෙන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. එක් එක් රේන්දයක් වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇත. එකී වේලාවන්හි දී සියලුම ටෙන්ඩර්කරුවන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ටෙන්ඩරයක් ඉදිරිපත් කර "වරප්‍රසාදය මිල දී ගත් තැනැත්තා"යැයි ප්‍රකාශ කරනු ලැබූ පසු එම දින ප. ව. 2.30ට පෙර උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත්

කොට යට කී විදේශ මත්පැන් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය. මෙම ගෙවීම් මුදලින් හෝ බැංකුවක් විසින් ''ගෙවීම් සඳහා'' ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් හෝ ආරක්ෂිත චෙක්පත් නැමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ විය යුතු ය.

06. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකි වූ තැබෑරුම් රේන්ද 2017.09.27 වැනි දින පෙ. ව. 10.30ට නැවත විකිණීම සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම ද මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. වැඩි විස්තර උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා දැනගත හැකි ය.

ආර්. ඒ. ඩී. ටී. එන්. තෙන්නකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
උඩපළාත- ගම්පොල.

2017 ජුනි මස 09 වැනි දින,
ගම්පොල- උඩපළාත
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

*2018 වර්ෂය සඳහා ගම්පොල උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත කරන ලද විදේශ මත්පැන් තැබෑරුම් ලැයිස්තුව*

| *අංකය හා නම* | *කොට්ඨාසය* | *තැබෑරුම් පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම් විවෘත කර තබන වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය සහ වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ.* |
|---|---|---|---|---|---|
| 01. පුස්සැල්ලාව | උඩපළාත | පුස්සැල්ලාව නගර සීමාව තුළ | පෙ. ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 2017.08.21 වැනි දින පෙ. ව. 10.30 | 3,000.00 |

08-21/2

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. කල්මුණේ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමක්

කල්මුණේ නගර සභා සීමාවන් තුළ කල්මුණේ ගමේ බවුන්ඩ්‍රි පාරේ (Boundary Road) පිහිටි "කෙලක්කුපුර පොන්ගු වලව්" නැමති ඉඩමට බලයලත් මානක අහමඩ් එම් මහරූෆ් විසින් 2015.08.26 වන දින සාදන ලද අංක 264/05 දරණ පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහ කොළ වගාව ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය : පර්චස් 20.30

මෙම දේපල ආතම්බාවා මොහොමඩ් රජායි බන්ධනදායී වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම.-* අම්පාර සිට කල්මුණේ නගරයේ ප්‍රධාන පාරට මායිම්ව වම් පසින් පිහිටි තාරව හින්දු කෝවිල දක්වා පැමිණ මෙම කෝවිල ඉදිරියේ මුල්ල දෙසින් පිහිටි පාරට පිවිස එම පාරේ ගමන් ගෙන දකුණු දෙසට පිහිටි 2 වන පාරට හැරී (බවුන්ඩ්‍රි පාර නොහොත් මරියර් පාර) මෙම පාරේ ෆුර්කානියා මුස්ලිම් පල්ලිය හන්දිය පිහිටි ලං.වි.ම. (C.E.B.) 11 කණුව දක්වා පැමිණ මෙතැන් සිට 05 වන ලං.වි.ම. කණුව දක්වා ගමන් ගත් විට අදාල දේපල මෙම පාරේ වම් පසින් පිහිටා තිබේ.

2017 ක් වූ අගෝස්තු මස 24 වැනි දින පෙ.ව. 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2017.06.09 දින *රජයේ ගැසට් පත්‍රය* ද 2017.06.19 දින ලක්බිම, ඩේලිමිරර් හා තිනකරන් පුවත් පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 750,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90 % ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී.බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661835, 011-2661836

අයි.ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර,
මාවිල්මඩ, මහනුවර.
දුරකථන අංක : 081-2210595/ 071-8446374/ 071-4962449

08-182

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - තිරුක්කෝවිල් ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභා සීමාවන් තුල තිරුක්කෝවිල් ගමේ පිහිටි "තර්මරත්න මුද්ලියර් තෙන්නම් තෝට්ටම්" නැමැති ඉඩමට බලයලත් මානක පි තාමෙන්දරන් විසින් 2015.04.20 වැනි දින සාදන ලද අංක 75/2015 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහ කොළ වගාව ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය : පර්චස් 32.80

මෙම දේපල සුන්දරලිංගම් සසිකුමාර්, කදිරවේලුපිල්ලේ ක්‍රිස්ටිලයින් සංජිතා සහ මැග්ඩලින් කදිරවේලුපිල්ලේ යන අය බන්ධනදායීන් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම*.- තිරුක්කෝවිල් ඔරලෝසු කණුව අසල සිට අක්කරෙයිපත්තු පාරේ මීටර් 500 ක් පමණ තම්බිලූවිල් මධ්‍ය මහ විද්‍යාලය පාර දක්වා පැමිණ දකුණට හැරී තම්බිලූවිල් මධ්‍ය මහ විද්‍යාලය පාරේ මීටර් 300ක් පමණ ගමන් ගත් පසු අදාල දේපල මෙම පාරට මායිම්ව පාරේ දකුණු පසින් පිහිටා තිබේ.

2017 ක් අගෝස්තු මස 24 වැනි දින ප.ව. 1.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2017.06.09 දින *රජයේ ගැසට් පත්‍රය* ද 2017.06.19 දින ලක්බිම, ඩේලිමිරර් හා තිනකරන් පුවත් පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*. - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10 % (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 750,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000

ගැනුම් මිලෙන් 90 % ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී.බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661835, 011-2661836

අයි.ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර,
මාවිල්මඩ, මහනුවර.
දුරකථන අංක : 081-2210595/ 071-8446374/ 071-4962449

08-183

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. තිරුක්කෝවිල් ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභා සීමාවන් තුළ තම්බිලූවිල් කොට්ඨාස 1 ගමේ පිහිටි ඉඩමට බලයලත් මානක වී අබ්දුල් රහිම් විසින් 2010.12.28 වැනි දින සාදන ලද අංක වී ජ් ආර් 210/232 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ වගාව ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය : පර්චස් 31.6

මෙම දේපල සුන්දරලිංගම් සසිකුමාර්, කදිරවේලුපිල්ලේ ක්‍රිස්ටිලයින් සංජිතා සහ මැග්ඩලින් කදිරවේලුපිල්ලේ යන අය බන්ධනදායීන් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම.-* තිරුක්කෝවිල් ඔරලෝසු කණුව අසල සිට අක්කරෙයිපත්තු පාරේ කි.මී. 2.6 ක් ගමන් ගත් විට මෙම පාරේ පිහිටි බෝක්කු අංක 355/1 පසු කරන විට මෙම පාරට මායිම්ව පාරේ දකුණු පසින් අදාළ දේපල පිහිටා තිබේ.

2017 ක් අගෝස්තු මස 24 වැනි දින ප.ව. 1.45 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2017.06.09 දින රජයේ ගැසට් පත්‍රය ද 2017.06.19 දින ලක්බිම, ඩේලිමිරර් හා තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය .-* මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10 % (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2 % (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 750,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90 % ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී.බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661835, 011-2661836

අයි.ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර,
මාවිල්මඩ, මහනුවර.
දුරකථන අංක : 081-2210595/ 071-8446374/ 071-4962449

08-184

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පි. එල්. සි. (පැල්මඩුල්ල ශාඛාව)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පි.එල්.සි. (ලියාපදිංචි අංක පීකිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුණේ පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 697 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු තල්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තල්පිටිය ගමේ පිහිටි දෙඹගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ආර්. කුමාරගේ විසින් 2002 ජූලි මස 12 වන දින මැන සාදන අංක 1575 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් A දරන

ප්‍රමාණය අක්කර එකයි පර්චස් තිස්පහයි දශම පහ (අ. 1, රූ. 0, පර්.35.5) විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

මුතුමුණි නිහාල් චන්ද්‍රවංශ සිල්වා ණයකරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පි.එල්.සි ට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපල වර්ෂ 2017 ක්වූ සැප්තැම්බර් මස 04

වන දින පෙ.ව 10.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2017.01.27 වන දින *රජයේ ගැසට් පත්‍රය*ද, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2017.08.04 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද 2017.08.08 ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම*.- පානදුර සිට ගාලු පාර ඔස්සේ ගාල්ල දෙසට කි.මී. 3.25 ක් පමණ ගමන් කර තල්පිටිය පාලම පසුවනවාත් සමගම දකුණට ඇති ගල් අතුරා ඇති පොදු පාරේ (මේද පටුමග) ගමන්කර ඉදිරියෙන් ඇති බ්ලූ වෝටර්ස් හෝටලය දෙසට මීටර් 200 ක් පමණ ඉදිරියට ගොස් දුම්රිය හරස් මාර්ගය පසුකරනවාත් සමගම දකුණට හැරී මීටර් 250 ක් ගමන් කළ විට අදල දේපල වම් අත පැත්තේ හොටෙල් බාගෝ එකට යාබදව පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

(01) ගැනුම් මිලෙන් සියයට දහයක් (10%) (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%) (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකිණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) (04) නොතාරිස් ගාස්තුව රු. 2000/- (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම් (07) ගැණුම්කරු විසින් එකතු කල වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි. (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුලදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ පැල්මඩුල්ල ශාඛාවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරික්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර, කොළඹ 12
දුරකථන/ෆැක්ස් 011- 2445393
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන්, පී. එල්. සී,
අංක 17, මහා වීදිය, පැල්මඩුල්ල.
දුරකථන අංක 045 - 2275924-5
ෆැක්ස් අංකය : 045-2275926

08-177

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කොට්ටාව ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්ද වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි නමට ලියන ලද්දවූද 2012 අප්‍රේල් 10 වන දින සහතික කළ අංක 4340 දරන බැඳුම්කරය මගින් අරුණ ගංගානාත් යහලදෙණිය ණයකරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියළු ස්ථාපිත ගෙවීම් සහ වෙන්දේසිකරුගේ ගාස්තුව ඇතුලු සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල එම දේපල පිහිටි ස්ථානයේදී

වර්ෂ 2017 ක්වූ අගෝස්තු මස 28 වැනි දින පෙ.ව 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ පල්ලේ පත්තුවේ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොට්ටාව 496බී ග්‍රාම නිලධාරී වසමේ මහරගම නගර සභා සීමාව තුල කොට්ටාව හි පිහිටි අවිස්සාවේල්ල පාරේ වරිපනම් අංක 914/20 දරන දෙණියවත්ත මිල්ලගහවත්ත හෙවත් දෙණියාවල මිල්ලගහවත්ත සහ දෙණියවලකුඹුර නැමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් 1984 සැප්තැම්බර් 25 දින අතුරු බෙදීමකින් සාදන ලද අංක 1570 දරන පිඹුරේ ලොට් 10 ද) බලයලත් මිනින්දෙරු එන්. පී. ඇල්විටිගල විසින් 2010 ජුනි 17 දින සාදන ලද අංක 3477 දරන පිඹුරේ ලොට් 1 ලෙස ලකුණු කර ඇති පහත දැක්වෙන ඉඩම් කොටස විශාලත්වය පර්චස් දහතුනක් (අ:0-රූ:0-පර්:13) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේත් සමඟ වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය 2015.12.04 වන දින *රජයේ ගැසට් පත්‍රය* සහ 2016.06.06 වන දින ලක්බිම, ඩේලිමිරර් සහ තිනකුරල් පුවත්පත්ද බලන්න.

*ඉඩමට පිවිසීම* .- කොට්ටාව නගරයේ සිට අවිස්සාවේල්ල පාරේ (හයිලෙවල් පාරේ) මහරගම දෙසට මීටර් 250 ක් පමණ ගමන් කර වමට හැරුණු විට කිත්සිරි පෙදෙස හමුවේ. (හරියටම කොට්ටාව හැටන් නැෂනල් බැංකුවට කලින්) එම මාවතේ මීටර් 150 ක් පමණ ගමන් කළ විට දකුණු පැත්තේ වංගුව හමුවන අතර අදළ දේපල එම පාරේ වම් අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසාන වූ වහාම උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ.

(01) ගැනුම් මිලෙන් සියයට දහයක් (10%), (02) ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකිණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුලදී හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත ගෙවිය යුතුයි. දින 30ක් තුළදී ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල ආපසු නොගෙවන අතර, දේපල නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරික්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර, කොළඹ 12.
දුරකථන අංක : 011-2445393, 011-2396520
ෆැක්ස් අංකය : 011-2445393
ඊමේල් senaservice@sltnet.lk

ජ්‍යෝෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්),
හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී,
අංක 479, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.
දුරකථන අංකය : 011-2664664

08-178

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.-පැල්මඩුල්ල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මඟින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුණේ පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 697 ග්‍රා. නි. කො. උතුරු තල්පිටිය ග්‍රාම නිළධාරි කොට්ඨාශයේ තල්පිටිය ගමෙහි පිහිටි දොඹගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ආර්. කුමාරගේ විසින් 2002 ජූලි මස 12 වන දින මැන සාදන ලද අංක 1575 දරන පිඹුරෙන් බෙදා වෙන්කරන ලද ලොට් ඒ දරන

ප්‍රමාණය අක්කර එකයි පර්චස් තිස්පහයි දශම පහ (අ:1 රූ:0 පර්:35.5) විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලුම දේත් සමඟ වේ.

ශ්‍රී ලංකා රජය යටතේ සංස්ථාපිත නීත්‍යානුකූල සමාගමක් වන දෙහිඹිවිට, මාගම්මන, පනාවත්ත පාරේ, අංක 50 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සබරගමුව ටී (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස සහ මුතුමුණි නිහාල් චන්ද්‍රවංශ සිල්වා උකස්කරු හැටියට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ

වර්ෂ 2017 ක්වූ සැප්තැම්බර් මස 04 වැනි දින පෙ. ව. 10.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2017.01.27 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2017.08.04 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2017.08.08 ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.-* පානදුර සිට ගාලු පාර ඔස්සේ ගාල්ල දෙසට කි.මී. 3.25 ක් පමණ ගමන් කර තල්පිටිය පාලම පසුවනවාත් සමඟම දකුණට ඇති ගල් අතුරා ඇති පොදු පාරේ (මේදා පටුමඟ) ගමන්කර ඉදිරියෙන් ඇති බ්ලූ වෝටර්ස් හෝටලය දෙසට මීටර් 200 ක් පමණ ඉදිරියට ගොස් දුම්රිය හරස් මාර්ගය පසුකරනවාත් සමඟම දකුණට හැරී මීටර් 250ක් ගමන් කළවිට අදාළ දේපළ වම් අත පැත්තේ හොටෙල් බාගෝ එකට යාබදව පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%) (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකිණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) (04) නොතාරිස් ගාස්තුව රු. 2000, (05) ලිපිකරු හෝ සෝෂක වේතනය රු. 500/- (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම් (07) ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුලදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ පැල්මඩුල්ල ශාඛාවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර, කොළඹ 12.
දුරකතන/ෆැක්ස් : 011-2445393,
ඊමේල් senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ,
අංක 17,
මහා වීදිය, පැල්මඩුල්ල.
දුරකතන අංක : 045 - 2275924-5,
ෆැක්ස් අංකය : 045 - 2275926.

08-175

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. තිරුක්කෝවිල් ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිම

කල්මුණේ නගර සභා සීමාවන් තුළ කල්මුණේ ගමේ වන්නියර් පාරේ පිහිටි ඉඩමට බලයලත් මානක විජේන්ද්‍රන් විසින් 2009/02/11 වැනි දින සාදන ලද අංක R/ 63/ 2009 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහ කොළ වගාව ඇතුළු අනෙකුත් සියලු දේ,
ඉඩමේ ප්‍රමාණයඃ පර්චස් 14.89.

මෙම දේපළ සුන්දරලිංගම් සසිකුමාර්, කදිරවේලුපිල්ලේ ක්‍රිස්ටිලයින් සංජිතා සහ මැග්ඩලින් කදිරවේලුපිල්ලේ යන අය බන්ධනදායින් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

දේපළට පිවිසීමඃ කල්මුණේ මධ්‍යම බස් නැවතුම් ස්ථානයේ සිට අක්කරෙයිපත්තු ප්‍රධාන මාර්ගයේ මීටර් 25ක් පමණ ගිය විට වම් දෙසින් පිහිටි මුරුකන් කෝවිල් පාරට පිවිස එම පාරේ මීටර් 125ක් ගමන් ගෙන දකුණට පිහිටි වන්නියර් පාරට හැරී එම පාරේ මීටර් 550ක් පමණ බගවාන් ශ්‍රී සත්‍යසායි සේවා මධ්‍යස්ථානය දක්වා ගමන් ගෙන වමට හැරී අඩි 10ක් පමණ පළල පුද්ගලික පටුමග ඔස්සේ මීටර් 17.5 ක් පමණ ගිය පසු එම මාර්ගයේ අවසානයේ අදාළ දේපළ පිහිටා තිබේ.

2017 ක්වූ අගෝස්තු මස 24 වැනි දින පෙ.ව.10.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2017.06.09 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2017.06.19 වැනි දින ලක්බිම, ඩේලිමිරර් හා තිනකරන් පුවත් පත් බලන්න.

*ගෙවීම් ක්‍රමය.-* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 750,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්නඃ* ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී.බී. ජයා මාවත, කොළඹ 10.

දුරකතන අංක : 011-2661835, 011-2661836,

අයි.ඩබ්ලිව්. ජයසූරිය
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර,
මාවිල්මඩ, මහනුවර.
දුරකථන අංක : 081-2210595/ 071-8446374/ 071-4962449.

08-181

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - මානිපායි ශාඛාව

1990 අංක 4 දරක බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිම

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වලික් අමාම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිරිතදිග වලික්අමාම් ප්‍රාදේශීය සභා සීමාවේ පාණ්ඩතිරිප්පු ග්‍රාම නිලධාරී වසමේ පාණ්ඩතිරිප්පු වසමේ ශාන්ත

ඟාතිමා පටුමගේ පිහිටි 'කලඩ්ඩි නොන්කනෙයි නෙදුන්කලඩ්ඩි' නමැති ඉඩමට බලයලත් මානක ඒ. කන්දසාමි විසින් 2014/01/14 වැනි දින අංක 1097 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 01 නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ඟාතිමා පටුමගේ වර්පනම් අංක 52/5 දරන නිවාස ගොඩනැගිල්ල ඇතුළු අනෙකුත් සියලු දේ, ඉඩමේ ප්‍රමාණය: (02 LcmVc - 8.92 kls)

මෙම දේපළ අරුලානන්දම් ජොන්සන් අමලදාස් හා මාරි රොෂානි අමලදාස් යන අය බන්ධනදායින් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.-* යාපනය නගරයේ සිට කරෙයිනගර් පාරේ ගමන් ගෙන මානිපායි - තොඩ්ඩිලාඩි හන්දිය සහ සීරනි පසු කර පෙරියවිලාන් හන්දිය දක්වා පැමිණ එම පාරේ පාණ්ඩතිරප්පු ඟාතිමා පල්ලිය වම් පසින් පිහිටි පටුමගේ ගමන්ගෙන පල්ලිය පිටුපස දක්වා පැමිණ දකුණට හැරී මීටර් 50ක් පමණ ගමන් ගෙන නැවත වමට හැරී එම පාරේ ගමන් ගත් විට පාරේ දකුණු පසින් අදාළ දේපළ පිහිටා තිබේ.

2017 ක්වූ අගෝස්තු මස 31 වැනි දින පෙ.ව.11.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*යෝජනා සම්මුතිය සඳහා* : 2017.01.20 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2017.01.25 වැනි දින ලක්බිම, ඩේලිමිරර් හා තිනකුරල් පුවත් පත් බලන්න.

*ගෙවීම් ක්‍රමය.-* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු.500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000/-

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පවත්වනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමඟ වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න:* ජොෂ්ඨ කළමනාකරු (අයකිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී.බී. ජයා මාවත, කොළඹ 10.

දුරකතන අංක : 011-2661835, 011-2661836, 011-2661826.

අයි.ඩබ්ලිව්. ජයසූරිය
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර,
මාවිල්මඩ, මහනුවර.
දුරකතන අංක : 081-2210595/ 071-8446374/ 071-4962449.

08-185

---

**ඩී එෆ් සී සී බැංකුව පී එල් සී**
**(ඩී එෆ් සී සී වර්ධන බැංකුව පී එල් සී හි අනුප්‍රාප්තික)**

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතෙහි 8 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 1048 සහ 518/781/101 සහ 569/225/821 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පස්දුන් කෝරළේ, උතුරු මහ පත්තුවේ, අගලවත්ත ප්‍රාදේශීය සභා සීමාවට අයත්, අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හල්ලෝවිට අංක 827/B ග්‍රාම නිලධාරි වසමේ පිඹුර පිහිටි, "මැද්දෙග්වත්ත උඩකට්ටිය" සහ "තම්බගොඩ කැලේ" ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු ඩබ්. එල්. ෆොන්සේකා විසින් සාදන ලද 2011 ජනවාරි මස 25 වැනි දිනැති අංක 4223 දරන පිඹුරේ දක්වෙන සීමා නිර්ණය කර බෙද වෙනකරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්: 34, රූඩ්: 03, පර්: 06 එහි පිහිටි පස, රබර් පාලක කාර්යාලයේ ලියාපදිංචි අංක 828/E4/TL 11 දරන රබර් වගාව, නිවාස දෙක, අනෙකුත් ගොඩනැගිලි සහ සියල්ල සහිතව මතුගම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් ජීවනී වීරසේන විසින් සහතික කරන ලද, 2012 ජුනි මස 13 වැනි දිනැති අංක 1048 දරන, පිළිවෙලින් කළුතර ප්‍රසිද්ධ නොතාරිස් ඩී ඩී ඒ ටී අල්විස්, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී පී ඩබ් මීගහවෙල සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. රණතුංග යන අය විසින් සහතික කරන ලද 2013 ජුනි මස 20 වන දිනැති, 2013 ජූලි මස 01 වැනි දිනැති සහ 2013 ජූලි

මස 03 වන දිනැති අංක 518/781/101 දරන සහ පිළිවෙලින් කළුතර ප්‍රසිද්ධ ඩී සී ඒ ටී අල්විස්, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන් එස් රණතුංග සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී පී ඩබ් මීගහවෙල යන අය විසින් සහතික කරන ලද 2013 ඔක්තෝබර් මස 14 වන දිනැති, 2013 ඔක්තෝබර් මස 28 වන දිනැති සහ 2013 ඔක්තෝබර් මස 30 වන දිනැති අංක 569/225/821 දරන උකස්කරයන් ප්‍රකාර, බදුරලියේ, "අශාන් රබර් කර්මාන්තශාලාව" නම් තනි පුද්ගල ව්‍යාපාරය පවත්වාගෙන යන සන්ජය අශාන් ගලබොඩ විසින්

ඩී එෆ් සී සී බැංකුව පී එල් සී (ඩී එෆ් සී සී වර්ධන බැංකුව පී එල් සී හි අනුප්‍රාප්තික) ට උකස් කරන ලදු ව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව පී එල් සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින්

2017 අගෝස්තු මස 23 වෙනි දින (බදාදා) පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% ද (සියයට දෙකහමාර),
4. රු. 93,000 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ සහ සෝෂකගේ ගාස්තුව රු. 1,000.00,
4. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.00.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුව පී එල් සී හි නීති දෙපාර්තමේන්තුව අමතන්න :
දුරකතන අංක 011 - 2371371

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ / අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි".

ශොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 125 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

08-99

---

**මහජන බැංකුව - පිළියන්දල ශාඛාව**

අංක 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන ඈ වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේපත්තුවේ කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ දම්පේ යන ගම පිහිටි ''කහටගහවත්ත'' ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර බිංදුවයි රූඩ් බිංදුවයි පර්චස් තිස් හතරයි දශම අටයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 34.80) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ.

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2017 අගෝස්තු මස 20 වැනි දින පෙ. ව. 11.30 දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2009.08.21 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* 2009.10.12 වැනි දින දිනමිණ, ඩේලි නිව්ස් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.-* පිළියන්දල නගරයේ සිට කි. මී. 1 පමණ මොරටුව පාරේ සුවාරපොල හන්දිය තෙක් ගොස් වම්පසට ඇති බටකැත්තර පාරේ කි. මී. 2 පමණ ගියවිට දකුණු පැත්තේ දුම්රිය පාරේ කි. මී. 2 ක් පමණ ගියපසු පාරට දකුණු පස මාම්පේ සංචාරක හෝටලයට ද මී. 500 පෙර මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය. -*

1. ගැනුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, (කොළඹ පිටත) සහකාර කළමනාකාර, අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 2825101, 2825102 ෆැක්ස් අංකය : 817737.

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30)ක් ඇතුලත නොගෙවුහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාමවිනිසුරු,
(මුළු දිවයිනටම)

අංක 11/55, බෝගහවත්ත, කුඩාබුත්ගමුව,
අංගොඩ.
දුරකථන අංක 011- 2053286
072-0881044/072-3207533.

08-19

---

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ පහත දැක්වෙන දිනයේ දී එකී දේපළ පිහිටි ස්ථානයේ දී එහි දක්වා ඇති වේලාවේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (හෝමාගම ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත) හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ කඩුවෙල මහ නගර සභා සීමාව ඇතුලත කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුලත සුහුතිපුර ග්‍රාම නිලධාරී කොට්ඨාස අංක 492 ඇතුලත මිනිවන්විල බත්තරමුල්ල තලංගම, 2 වැනි පටුමග, සුහුතිපුර දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ජේ. ඒ. ඩබ්. කාර්වල්හෝ විසින් සකසන ලද අංක 43/2012 දරන 2012 අප්‍රේල් මස 17 දිනැති පිඹුරෙහි බෙද වෙන් කරන ලද ලොට් 1 ඒ වශයෙන් ලකුණු කළ බිම් කොටස වූ (බලයලත් මානක සී. ඊ. එන්. ජයවර්ධන විසින් සකසන ලද අංක 722 සහ 1995 ඔක්තෝබර් මස 09 දිනැති පිඹුරෙහි ලොට් අංක 1, 2, 3 සහ 4 හි සහ බලයලත් මානක, එස්. ඩී. ලියනසූරිය විසින් සකසන ලද අංක 6903 දරන 1998 ජුනි 06 දිනැති පිඹුරෙහි ලොට් 4 බී සහ 3 බී හි නැවත මැනීමක් සහ ඒකාබද්ධ කිරීමක් වන) දැනට වරිපනම් අංක 36/6, 36/7 සහ 36/8 දරන ඉඩම වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම/පත්‍රිරු බී 627/92 හි ලියාපදිංචි කර ඇත.

බිම් ප්‍රමාණය : අ. 0 රූ. 1 පර්. 15.40

වර්ෂ 2017 ක් වූ අගෝස්තු මස 23 වැනි දින පෙ. ව. 11.00 ට

*දේපළට පිවිසෙන මාර්ගය.-* බත්තරමුල්ලෙන් ගමන් කර ශ්‍රී සුභූතිපුර පාර දිගේ සෙත්සිරිපාය පසු කර මීටර් 300ක් පමණ ගොස් කඩුවෙල පාරෙන් ඔබ්බට දිවෙන ශාඛා පාරෙන් වමට හැරී සුභූති මාවත දිගේ මීටර් 75ක් පමණ ගමන් කරන්න. ඉන් අනතුරුව දකුණට හැරී පළවන සුභූති අතුරු පාර දිගේ මීටර් 100ක් පමණ ගිය විට විෂයගත දේපළට ළඟා විය හැක.

''ජෙනරල් ඉන්ජිනියර්ස් ඇන්ඩ් සප්ලයර්ස් කම්පැනි'' යන නාමය විලාසය සහ ව්‍යාපාර නාමය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් ලෙස ව්‍යාපාර ගෙන යනු ලබන ඩොමිනික් සේවියෝ ඇන්තනි රොෂාන් මෝතා විසින් කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුන ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ආර්. එල්. සී. රණසිංහ විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2013.10.11 දිනැති අංක 423 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ වර්ෂ 2014.05.23 දිනැති අංක 536 දරන උකස් බැඳුම්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. මධුමාලි අල්විස් විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2014.07.24 දිනැති අංක 299 දරන උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2016.05.13 වැනි දින ඩෙයිලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත් පත් සහ එදින *ගැසට්* පත ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලේ 10% ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්),
4. ප්‍රචාරක වියදම් ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
6. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500 ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති

10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු කළමනාකාරු, ණය අයකර ගැනීම් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී.එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-4667230.

තුසිත් කරුණාරත්න,
උසාවි කොමසාරිස් සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 182/3(50/3), විහාර මාවත, කොළොන්නාව.
දුරකථන අංක 011-3068185, ෆැක්ස් අංකය : 011-2572940.

08-208

---

## සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කළින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි.

එම්. එල්. කේ. බෝධිනායක
ගිණුම් අංක : 0160 5000 2822

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2016.07.28 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පනස් ලක්ෂ අනූ තුන් දහස් නමසිය තිස් නමයයි ශත පනස් දෙකක (රු. 5,093,939.52) මුදල ද, 2016 ජුනි 28 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හතලිස් තුන් ලක්ෂ අනූ දෙදහස් දහ හතයි ශත දහ හතරක් (රු. 4,392,017.14) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනක් (13%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2016.09.09 දින *රජයේ ගැසට් පත්‍රයේ* 2016.09.29 දින ''දිවයින'' සහ තිනකුරල් සහ අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2017.08.21 වැනි දින පෙ. ව. 9.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ පරණකුරු කෝරළේ මාවත පත්තුවේ කෑගල්ල සුළු නගර සභා සීමාවන් තුළ ඔලගම පිහිටි ''වකයායේවත්ත සහ දෙල්ගහමුලහේන'' (බලයලත් මානක තැන ටී. එන්. කාදර් යන අය විසින් සාදන ලද 2004 මැයි 26 දතම හා අංක 4066/අ පිඹුරෙහි ලොට් 03 සහ බලයලත් මානක තැන එල්. බී. බැද්දවෙල යන අය විසින් සාදන ලද අංක 2568/ඒ හි , දිස්ත්‍රික් උසාවි නඩු අංක 18734, ලොට් 1, 2, 3, 4, 5 සහ 6 හි නැවත මිනුමක් වන) යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. ඉන්ද්‍රානි මල්ලිකා යන අය විසින් සාදන ලද 2011 නොවැම්බර් මස 30 දතම හා අංක 876/11 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන් කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : කෑගල්ල සිට ඔලගම දක්වා දිවෙන පාර, නැගෙනහිරට : වෙදරාලගේ වත්ත දකුණට : මිරිහෙල්ල හි අරඹ ඉඩම සහ බස්නාහිරට : අංක 2568/ඒ දරන පිඹුරේ ලොට් 8 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් හතක් (අ. 0 රූ. 1 පර්. 37) හෝ හෙක්ටයාර් 0.1947 ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරට අනුවය.

එකී ලොට් 2 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි:

එකී ඔලගම ග්‍රාමයේ පිහිටි ''වකයායේවත්ත සහ දෙල්ගහමුලහේන'' (බලයලත් මානක තැන එල්. බී. බැද්දෙවෙල යන අය විසින් සාදන ලද අංක 2568/ඒ දරන පිඹුරේ ලොට් 1, 2, 3, 4, 5 සහ 6 හි නැවත මිනුමක් සහ උප බෙදුමක් වන, කෑගල්ල දිස්ත්‍රික් උසාවියේ නඩු අංක 18734) යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී. එන්. කාදර් යන අය විසින් සාදන ලද 2004 මැයි 26 දතම හා අංක 4066/අ දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන් කොට ලොට් 3 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : පාර, නැගෙනහිරට : වෙදරාලගේ වත්ත සහ ඉලුක්පැලැස්සේ වත්ත, දකුණට : මිරිහල්ල යන අය විසින් හිමිකම් කියනු ලබන අරඹ සහ බස්නාහිරට : නඩු අංක 18734 යටතේ කෑගල්ල දිස්ත්‍රික් උසාවියේ තැන්පත් කොට ඇති ලේඛණයට අනුව, බලයලත් මානක තැන එල්. බී. බැද්දෙවෙල යන අය විසින් සාදන ලද අංක 2568/ඒ දරන පිඹුරේ නිරූපිත ලොට් 8 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් හතක් (අ. 0 රූ. 1 පර්. 37) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි, සහ එහි පිහිටි සෑම සියළු දේ එකී පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව ඒ 573/90 යටතේ කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-194

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## *උපලේඛනය*

**2017**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **අගෝස්තු** | 2017.08.04 | සිකුරාදා | 2017.07.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.08.11 | සිකුරාදා | 2017.07.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.08.18 | සිකුරාදා | 2017.08.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.08.25 | සිකුරාදා | 2017.08.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.08.31 | බ්‍රහස්පතින්දා | 2017.08.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2017.09.08 | සිකුරාදා | 2017.08.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.09.15 | සිකුරාදා | 2017.08.31 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2017.09.22 | සිකුරාදා | 2017.09.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.09.29 | සිකුරාදා | 2017.09.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2017.10.06 | සිකුරාදා | 2017.09.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.10.13 | සිකුරාදා | 2017.09.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.10.20 | සිකුරාදා | 2017.10.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.10.27 | සිකුරාදා | 2017.10.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.